ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2088/59 - 2018 සැප්තැම්බර් මස 14 වැනි සිකුරාදා - 2018.09.14

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත

2018 අංක 25 දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත මගින් අවසන් වරට සංශෝධනය කෙරුණු 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ 58 (අ) වගන්තියේ (1) සහ (3) උපවගන්තීන් යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් දිසානායක මුදියන්සේලාගේ ලලිත් අයිවන් දිසානායක වන මවිසින් උපලේඛනයේ දක්වා ඇති පරිදි එකතු කළ අගය මත සංචාරක බදු ආපසු ලබාදීමේ ක්‍රමවේදය මෙම නිවේදනය මගින් පහත පරිදි නිශ්චිතව දක්වා සිටිනු ලැබේ.

i. (1) වන උපවගන්තියේ (ඇ) අයිතමය යටතේ ගැනෙන යම් සංචාරකයෙකුගේ ඉන්වොයිසි
ii. (3) වන උපවගන්තියේ (අ) අයිතමය යටතේ වන බලයලත් සිල්ලර වෙළෙන්දන් ලියාපදිංචිය සඳහා වන කොන්දේසි

ඩී. එම්. එල්. අයි. දිසානායක,
දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්.

2018 ක් වූ සැප්තැම්බර් මස 13 වැනි දින,
කොළඹ 02,
දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ දී ය.

උපලේඛනය

**එකතු කළ අගය මත සංචාරක බද්ද ආපසු ලබාදීමේ ක්‍රමවේදයෙහි ක්‍රියාකාරීත්වය**

***I වැනි කොටස - (1) වන උපවගන්තියේ (ඇ) අයිතමය යටතේ ගැනෙන යම් සංචාරකයෙකුගේ ඉන්වොයිසි***

කොමසාරිස් ජනරාල් විසින් හෝ ඔහු විසින් බලය පවරන පරිදි බලයලත් සිල්ලර වෙළෙන්දන් වෙත පිටපත් තුනකින් යුතු අනුක්‍රමික අනුපිළිවෙළක් සහිත එකතු කළ අගය මත සංචාරක බදු ආපසු ගෙවීමේ ඉන්වොයිසි (TVRI) ලබාදෙනු ඇත. මෙම පොතක (TVRI) ඉන්වොයිසි 50 ක් ඇත.

ඕනෑම සංචාරකයෙකු වෙත, ඔහුගේ ඉල්ලීම පරිදි බලයලත් සිල්ලර වෙළෙන්දෙකු විසින් TVRI නිකුත් කිරීම, සැපයූ භාණ්ඩවල බදු අයකළ හැකි වටිනාකම නියම කරන වටිනාකමට නොඅඩු වන අවස්ථාවන්හීදී, එවැනි සංචාරකයෙකුගේ තත්ත්වය එනම් වීසා වර්ගය, වීසා කාලපරිච්ඡේදය සහ නවාතැන් ගන්නා දින ගණන වැනි දේ තහවුරු කර ගැනීමෙන් අනතුරුව, සිදු කිරීම අවශ්‍යය.

II වැනි කොටස - (3) වන උපවගන්තියේ (අ) අයිතමය යටතේ වන බලයලත් සිල්ලර වෙළෙන්දන් ලියාපදිංචිය සඳහා වන කොන්දේසි

i. බලයලත් සිල්ලර වෙළෙන්දෙකුගේ තත්ත්වය අපේක්ෂා කරන ඕනෑම පුද්ගලයෙකු එකතු කළ අගය මත බද්ද සඳහා ලියාපදිංචි වී ඇති පුද්ගලයෙකු විය යුතු ය.

ii. එවැනි පුද්ගලයෙකු සිය ව්‍යාපාරික ස්ථානය තුළ නිදහස් කිරීම් ප්‍රදානය කර ඇති භාණ්ඩ ප්‍රදර්ශනය කළ යුතු ය.

09 - 829

1A - PG 4227 — 107 (2018/09) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*